සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව

ගණිතය - 4 ශ්‍රේණිය / තෙවන වාරය - සැප්තැම්බර් මාසය - 2 සතිය

සැකසුම - රත්නපුර අධ්‍යාපන කලාපය / කේ.වි. අසංක දේශප්‍රිය අබේරත්න.

# 29 ඒකකය - පරිමාව හා ධාරිතාව 2

**දුවේ පුතේ අද අපේ පාඩම පරිමාව හා ධාරිතාවය......ඔයාලා ගොඩක් කැමතිම පාඩමක් තමයි...එහෙනම් හැමෝම ලෑස්ති වෙන්නකෝ අද පාඩමට.....**

ක්‍රියාකාරකම 1

- මේ සඳහා මෙම ද්‍රව්‍ය සොයා ගන්න. හැකි නම් මිනුම් සරාවක්. එසේ නැති නම් ලීටර 2 , ලීටර 1 , ලීටර එකහමාර , මිලිලීටර 500, මිලිලීටර 250 ,යෝගට් කෝප්පයක්(මි.ලි.200) , මිලිලීටර100 ජලය අල්ලන බෝතල් හෝ භාජන
- සාමාන්‍ය බේසම් 2 ක් , ලොකු බේසමක් , ජලය
- පහත දැක්වෙන ආකාරයේ පත්‍රිකා කිහිපයක් සකස් කර ගන්න.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2l 800ml | 3l 350ml | 5l 100ml | 10l 750ml | 1l 500ml | 750ml | 6l 400ml |

- මුලින් තමන් කැමති පත්‍රිකාවක් ගෙන එහි සඳහන් ප්‍රමාණයට ජලය එක බේසමකට දමන්න. නැවත තවත් පත්‍රිකාවක් ගෙන ඒහි සඳහන් ප්‍රමාණයට ජලය අනෙක් බේසමට දමන්න.
- දැන් බේසම් දෙකේම අති ජලය ලොකු බේසමට දමන්න. දැන් ලොකු බේසමේ ඇති ජලය මිනුම් සරාව හෝ බෝතල් ඇසුරින් නිවැරදිව මැන බලන්න.
- මේ සඳහා වැඩිහිටි සහය ලබා ගන්න.ලොකු බේසමේ ජලය , පොඩි බේසම් දෙකේ තිබූ ජලය එකතු වීමෙන් ඇති වූ බව දරුවාට කියා දෙන්න. ( එකතු කිරීමේ සංකල්පය)

ක්‍රියාකාරකම 2

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2l 800ml | 3l 350ml | 5l 100ml | 10l 750ml | 3l 500ml | 750ml | 6l 400ml |
| ↓ | ↓ | ↓ | ↓ | ↓ | ↓ | ↓ |
| 1l 300ml | 3l | 4l 100ml | 5l 250ml | 1l 500ml | 500ml | 2l 100ml |

- ඉහත දැක්වෙන ආකාරයේ පත්‍රිකා යුගල කිහිපයක් සාදා ගන්න.පෙර ක්‍රියාකාරකාමේ ආකාරයට ද්‍රව්‍ය සපයා ගන්න.
- මුලින් එක බේසමකට පළමු පත්‍රිකාවේ දැක්වෙන ජලය ප්‍රමාණය පුරවා ගන්න. ඒ සඳහා මිනුම් සරාව හෝ බෝතල් ඇසුරින් ප්‍රමාණ නිවැරදිව මැන ගන්න.
- පසුව දෙවන පත්‍රිකාවේ සඳහන් ප්‍රමාණය නිවැරදිව ජලය පුරවන ලද බේසමෙන් මැන දෙවන බේසමට දමන්න.
- දැන් පළමු බේසමේ ඇති ජල ප්‍රමාණය මැන බලන්න.වැඩිහිටියන් විසින් මෙහිදි අඩු කිරීම යන සංකල්පය දරුවාට තහවුරු කරවන්න.
- අනතුරුව දෙවන බේසමේ ඇති ජලය ප්‍රමාණය මැන බලන්න.මෙහිදි භාජන දෙකෙහි ජල පරිමාවේ වෙනස යන සංකල්පය දරුවාට අවබෝධ කරවන්න. පහත වගුව පුරවන්න.

| | | | |
|---|---|---|---|
| ***1 බේසමේ ජලය*** | | ***2 බේසමේ ජලය*** | ***මුළු ප්‍රමාණය*** |
| 2 l 800 ml | + | 1 l 500 ml | |
| ***1 බේසමේ ඇති ජලය ප්‍රමාණය*** | | ***ඉවත් කළ ජලය ප්‍රමාණය*** | ***ඉතිරි ප්‍රමාණය*** |
| 2 l 800 ml | - | 1 l 300 ml | |
| ***1 බේසමේ ජලය*** | | ***2 බේසමේ ජලය*** | ***වෙනස*** |
| 2 l 800 ml | - | 1 l 300 ml | |